JMC vLearning
"your virtual learning partner"

# ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ

AAT අදියර I

BEN - ව්‍යාපාර පරිසරය

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

Level I
Business Environment
BEN - 104


# ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ



## මූල්‍ය වෙළෙඳපොළ

කෙටිකාලීන හා දිගුකාලීන අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා මුදල් අතිරික්තයක් පවතින සැපයුම්කරුවන් වෙතින් මුදල් හිඟයක් පවතින ඉල්ලුම්කරුවන් වෙත අරමුදල් ගලායාම් මාර්ගයන් වේ. ඒ අනුව පුද්ගලයින්ට හා සංවිධාන වලට ණයට ගැනීමට අවශ්‍ය කරන මුදල් එම මුදල් අතිරික්තයක් පවතින පුද්ගලයින් සමග ගෙන එනු ලබන ස්ථානයයි.

## ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ වර්ගීකරණය




ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## මූල්‍ය වෙළෙඳපොළෙහි කාර්යයභාරය

මූල්‍ය වෙළෙඳපොළක් රටක ආර්ථිකයට පහත ආකාරයට දායක වේ

1) ඉතුරුම් සංක්‍රමණය කිරීම
මූල්‍ය වෙළෙඳපොල තුළ සිටින අතරමැදිකරුවන් විසින් කුටුම්භ, ව්‍යාපාර හා රජය සතුවන අතිරික්ත අරමුදල් ආයෝජන අවශ්‍ය කරන හිග ඒකක වෙත ලබා දීම සිදුකරයි.

2) ආයෝජන එක්රැස් කිරීම
ආයෝජන අවශ්‍ය කරන ඒකක වලට අවශ්‍ය එම අරමුදල් සම්පාදනය කිරීමේ ප්‍රධාන කාර්යයභාරය මූල්‍ය වෙළෙඳපොළ මඟින් ඉටුකරයි.

3) ආර්ථික වර්ධනයට දායක වීම
ආර්ථිකයේ වඩාත් ඵලදායී අංශ වලට අරමුදල් ගලායාමට සැලැස්වීම තුලින් ආර්ථික සංවර්ධනයට දායක වේ.

4) ව්‍යවසායකත්ව වර්ධනයට හේතු වේ.
මූල්‍ය සම්පත් සුලභ කිරීම තුළින් ව්‍යවසායකත්වය දිරිමත් වේ.

5) කාර්මික සංවර්ධනයට දායක වීම
කාර්මික අංශයේ සංවර්ධනයට අරමුදල් ගලායාම තුලින් ආර්ථකය වර්ධනය වීමත් ජනතාවගෙ ජීවන තත්ත්ව හා සමාජ සුබසාධනය ප්‍රවර්ධනය වීමත් සිදු වේ.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ

### මුදල් වෙළෙඳපොළ

- කෙටිකාලීන අරමුදල් අවශ්‍යතාවයන් සඳහා මුදල් අතිරික්ත හා ඌන පර්ශව සම්බන්ධ කෙරෙන වෙළෙඳපොළ වේ.
- වසරකට අඩු කාලයක දී කල් පිරෙන සුරැකුම්පත් ගනුදෙනු වන වෙළෙඳපොල වේ.
- කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා සඳහා අරමුදල් සම්පාදනය මෙම වෙළෙඳපෙලෙන් සිදු වේ.

### භුවමාරු වන මූල්‍ය උපකරණ

- භාණ්ඩාගාර බිල්පත්,
- වාණිජ පත්‍රිකා,
- තැම්පතු සහතික

### මුදල් වෙළෙඳපොල සඳහා නිදසුන්

- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
- දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
- වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

## ප්‍රාග්ධන වෙළෙඳපොළ

- දිගු කාලීන අරමුදල් අවශ්‍යතාවයන් සඳහා මුදල් අතිරික්ත හා ඌන පර්ශව සම්බන්ධ කෙරෙන වෙළෙඳපොළ වේ.
- වසරකට වඩා වැඩි කාලයකදී කල් පිරෙන සුරැකුම්පත් ගනුදෙනු වන වෙළෙඳපොල වේ.
- දිගුකාලීන ද්‍රවශීල අවශ්‍යතා සඳහා අරමුදල් සම්පාදනය මෙම වෙළෙඳපෙළෙන් සිදු වේ.

## හුවමාරු වන මූල්‍ය උපකරණ

- භාණ්ඩාගාර බැදුම්කර,
- ණය සුරැකුම් (ණයකර),
- හිමිකම් සුරැකුම් (කොටස්)
- සාංසමික බැඳුම්කර දක්විය හැකියි

## ප්‍රාග්ධන වෙළෙඳපොල සඳහා නිදසුන්

අ) භාණ්ඩාගාර බැදුම්කර වෙළෙඳපොළ
ආ) සාංසමික බැඳුම්කර වෙළෙඳපොළ
ඇ) කොටස් වෙළෙඳ පොළ

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ අතර වෙනස

| ලක්‍ෂණය | මුදල් වෙළෙඳපොළ | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
|---|---|---|
| අරමුදල් වල කාල සීමාව | වසරකට වඩා අඩු කාල සීමාවක් ඇති ණය මුදල් පිළිබඳව කටයුතු කරයි. | වසරකට වඩා වැඩි කාල සීමාවක් ඇති දිගුකාලීන අරමුදල් පිළිබඳව කටයුතු කරයි. |
| මුදල් සැපයුම | ව්‍යාපාර කටයුතු වලට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය කිරීම වෙනුවෙන් අරමුදල් සපයයි. | වෙළෙඳ හා වාණිජ කටයුතු වලට අදාළ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා හා රජයෙ දිගුකාලීන අරමුදල් අවශ්‍යතා මූල්‍යනය කිරීම පිළිබඳව කටයුතු කරයි. |
| භාවිතා වන සුරැකුම්පත් | විනිමය බිල්පත්, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා | කොටස්, ණයකර, භාණ්ඩාගාර බැඳුම්කර |

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

## මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සැසඳීම

| ලක්ෂණය | මුදල් වෙළෙඳපොළ | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
|---|---|---|
| ප්‍රධාන ආයතන | මහ බැංකුව හා වාණිජ බැංකු මුදල් වෙළෙඳපොළේ ප්‍රධාන ආයතන වේ. | සංවර්ධන බැංකු, රක්ෂණ සමාගම් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ප්‍රමුඛ කාර්යයක් ඉටුකරයි. |
| සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ස්වභාවය | ද්විතීයික වෙළෙඳපොළක් නොමැත. | ද්විතීයික වෙළෙඳපොළක් පවතී. |
| බන්ධනය කිරීම | මුදල් වෙළෙඳපොළ කණ්ඩනය කිරීමක් නොමැත. | ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රාථමික හා ද්විතීයික ලෙස කොටස් දෙකකි |
| ගනුදෙනු සිදුවන ස්ථානය | බොහෝ විට දුරකථනය හරහා ගනුදෙනු සිදුවන අතර විධිමත් ස්ථානයක් නොමැත. | විධිමත් ස්ථානයක් ඇත. |



## විවිධ පදනම් යටතේ මූල්‍ය වෙළෙඳපොළ වර්ග කර දක්වන්න

<u>මූල්‍ය හිමිකම අනුව</u>
- හිමිකම් වෙළෙඳපොළ
- ණය වෙළෙඳපොළ

කල්පිරීමේ කාලය අනුව
- මුදල් වෙළෙඳපොළ
- ප්‍රාග්ධන වෙළෙඳපොළ

වෙළෙඳපොළ ස්වභාවය අනුව/ මූල්‍ය හිමකම්පෑම් නිකුත් කිරීමේ කාලය අනුව
- ප්‍රාථමික වෙළෙඳපොළ
- ද්විතීයික වෙළෙඳපොළ

මූල්‍ය හිමකම්පෑම් බෙදාහැරීමේ කාලය අනුව
- මුදල් / තත්කාලීන වෙළෙඳපොළ
- ඉදිරි රැකුම් හා ඉදිරි ගනුදෙනු වෙළෙඳ පොල

වෙළෙඳපොළ සංවිධාන සංයුතිය අනුව
- විනිමය වෙළෙඳපොල
- Over theCounter (OTC) Market

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

## සුරැකුම්පත් වෙළෙඳපොළ යනු කුමක්ද? එහි ලක්ෂණ මොනවාද?

සුරැකුම්පත් වෙළෙඳපොළ යන්නෙන් අදහස් වන්නේ ප්‍රාග්ධන වෙළෙඳපොළයි. ඒ අනුව වසරකට වඩා වැඩි කාලය දී කල් පිරෙන සුරැකුම්පත් ගනුදෙනු වන වෙළෙඳපොල වේ.

**සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ලක්ෂණ**

1) කොටස් ණයකර වැනි දිගුකාලීන සුරැකුම්පත් ගණුදෙනු වේ
2) සුරැකුම්පත් වලට පවතින ඉල්ලුම සැපයුම මත සුරැකුම්පත් වල මිල තීරණය වේ.
3) ප්‍රාග්ධන වෙළෙඳපොළ කටයුතු වලට පුද්ගලයින්, සමාගම්, රජය,බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන සහභාගී වේ.
4) සුරැකුම්පත් වෙළෙඳපොළට අයත් කොටස් වොළඳපොළ නිශ්චිත ස්ථානයක ස්ථානගතව ඇත.

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ගීකරණය කර දක්වන්න

ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ප්‍රධාන කොටස් දෙකකි.
<u>1) ප්‍රාථමික වෙළෙඳපොළ</u>

නව නිකුතු හෝ නව මූල්‍ය හිමිකම් සඳහා වූ වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ වේ. මෙය නව නිකුතු වෙළෙඳපොළ ලෙසද හැඳින්වේ. ප්‍රාග්ධන වෙළෙඳපොල මූල්‍ය උපකරණ මුල්වරට නිකුත් කරනු ලබන වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ වේ.

ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ප්‍රාග්ධන සම්පාදන මාර්ග
1) පොදු නිකුතුව 2) හිමිකම් නිකුතුව 3) පෞද්ගලික අරමුදල් සම්පාදනය

<u>2) ද්විතියික වෙළෙඳපොළ</u>

දැනටමත් නිකුත්නර ඇති සුරැකුම්පත් හුවමාරු වන වෙළෙඳපොල වේ. මෙයට කොටස් වෙළෙඳපොළ හා Over the Counter Market යන වෙළෙඳපොළ ද්විත්වයම අයත් වේ.

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

## ප්‍රාග්ධන වෙළෙඳපොලවල කාර්යභාරය හා වැදගත්කම පැහැදිලි කරන්න

ප්‍රාග්ධන සම්පාදනයෙහිලා ප්‍රාග්ධන වෙළෙඳපොල මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සීඝ්‍ර ආර්ථික දියුණුවක් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන සම්පාදනය ඉතා වැදගත් වේ. ආර්ථික වර්ධනය සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොලෙහි ඇති වැදගත්කම පහත පරිදි විස්තර කළ හැක.

(1) ඉතුරුම් හා ප්‍රාග්ධන සම්පාදනය

ප්‍රාග්ධන වෙළෙඳපොල රටක විවිධ පාර්ශවයන් (පුද්ගලයන් සමාගම් හා රජය වැනි) අතර අරමුදල් හුවමාරුවට පහසුකම් සපයයි. සුරැකුම්පත්වල ආයෝජනය කරන්නන්ට සාධාරණ ප්‍රතිලාභ හා කොටස් වෙළඳපොල තුළ පවතින ද්‍රවශීලතාවය යන වාසි දෙකම ලැබේ. මෙය රටක ප්‍රාග්ධන සම්පාදනය වේගවත් කිරීමට ඉවහල් වේ.

(2) ස්ථාවර ප්‍රාග්ධනය

ප්‍රාග්ධන වෙළෙඳපොළවල්/ කොටස් හුවමාරු පැවතීම මගින් සමාගම්වලට අවශ්‍ය කෙරෙන ස්ථාවර ප්‍රාග්ධනය ලබා ගැනීමට ඉඩකඩ සැලසේ. කිසියම් ස්ථාවර කාල සීමාවක් සඳහා අරමුදල් හිරකර තැබීමට ආයෝජනයන්ට නොහැකි වුවද සමාගම්වලට අරමුදල් අවශ්‍ය වනුයේ කිසියම් ස්ථාවර කාලසීමාවක් සඳහාය. නමුත් මෙම ගැටළුව විසඳාලීමට කොටස් හුවමාරුවට හැකියාව ලැබී ඇත. එනම්, සමාගම්වල ස්ථාවර ප්‍රාග්ධනය කෙරෙහි බලපෑමක් ඇති නොකරන ආකාරයට ආයෝජකයන්ට සුරැකුම්පත් මිලදී ගැනීමට හා විකිණීමට එමගින් හැකියාවක් ලැබෙයි.



3) කාර්මික වර්ධනය

කාර්මික අංශයේ ආයෝජන දිරිමත් කිරීමට ප්‍රාග්ධන වෙළෙඳපොළ වැදගත් වේ. සාංසමික බැඳුම්කර වල ආයෝජනය සිදු වීම තුලින් දිගුකාලීන කාර්මික ආයෝජනයන්ට අවශ්‍ය අරමුදල් සමාගම් වලට හිමි වේ

4) අරමුදල් නිවැරදි දිශාවන්ට යොමු කිරීමට හේතු වීම

වෙළෙඳපොළ මිල හා ඵලදායීතාවය යන සාධක මත ප්‍රාග්ධන වෙළෙඳපොල ආයෝජනයන් සිදු වන බැවින් ආර්ථිකයේ වඩාත් වැදගත් අංශ වලට අරමුදල් ගලා යාම ප්‍රාග්ධන වෙළෙඳපොල හරහා සිදුවේ

5) ප්‍රාග්ධන වෙළෙඳපොළ මගින් ණය පහසුකම් සැපයීම, ප්‍රාරක්ෂණ පහසුකම් සැපයීම, සමාගම් ප්‍රවර්ධනය කිරීම, විශේෂඥ උපදේශන සේවා යනා දී පහසුකම් සම්පාදනය කරනු ලබයි.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

6) ඌන සංවර්ධිත ප්‍රදේශ සංවර්ධනය සඳහා අරමුදල් යොමු කිරීමට දායක වේ.

7) විදේශ අරමුදල් ලබා ගැනීමට අවශ්‍ය සහසුකම් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළින් ලැබේ

8) ඉහළ ද්‍රවශීලතාවයක් ඇති කර ගැනීමට දායක වේ.

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## මුදල් වෙළෙඳපොළෙහි ලක්ෂණ

1. කෙටිකාලීන අරමුදල් අවශ්‍යතාවයන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වෙළෙඳපොල කි.
2. සුරැකුම්පත් වලට වසරකට වඩා අඩු කල් පිරීම් කාලයක් පවතී
3. ද්‍රවශීල තාවය ඉහළ වත්කම් ගනුදෙනු වලට සම්බන්ධ වේ.
4. සාමාන්‍යයෙන් දුරකථන භාවිතය මඟින් ගනුදෙනු සිදු වේ.
5. සමජාතීය වෙළෙඳපොලක් නොවේ (ඇරයුම් මුදල් වෙළෙඳපොල, ප්‍රතිග්‍රහණ මුදල් වෙළෙඳපොළ, බිල්පත් වෙලෙඳපොළ)
6. අරමුදල් සැළසුම් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී
7. නියාමන නම්‍යශීලී භාවයක් පවතී.

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC vLearning "your virtual learning partner"

## මුදල් වෙළෙඳපොළ තුලට සම්බන්ධ වන පාර්ශව

- රජය
- මහ බැංකුව
- පෞද්ගලික හා රාජ්‍ය බැංකු (බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂ බැංකු)
- රක්ෂණ සමාගම්
- බැංකු නොවන මූල්‍ය ආයතන
- පළාත් සභා
- මහජනතාව



## කොටස් හුවමාරුවක් යනු කුමක් ද?

කොටස් හා බැඳුම්කර ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට එම සුරැකුම්පත් විකිණීම ඇතුළුව ගණුදෙනු සිදුකරනු ලබන සියළුම ස්ථානවලින් කොටස් හුවමාරුවක් හෝ සුරැකුම්පත් වෙළෙඳපොළක් සමන්විත වේ.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## කොළඹ කොටස් හුවමාරුවෙහි කාර්යභාරය .

1. සුරැකුම්පත් හුවමාරුවට වෙළෙඳපොල පහසුකම් සැපයීම

සුරැකුම්පත් මුදල් බවට මෙන්ම මුදල් සුරැකුම්පත් බවටද පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි ආකාරයට සුරැකුම්පත් වලට ඉහළ ද්‍රවශීලතාවයක් ලබා දීමට කටයුතු කිරීම

2. සුරැකුම්පත් නිවැරදිව සමාලෝචනය කිරීම

සුරැකුම්පත් මිලට ගත් හා විකුණන ලද මිල ගණන් වාර්තාගත කරනු ලබන අතර ඒවා ප්‍රසිද්ධියට පත්කෙරේ. මෙම මිල ගණන් වෙළෙඳපොල මිල කැඳවුම් ලෙස හැඳින්වේ. මෙම කැඳවුම් හරහා බවත් අයෙකු සතුව ඇති සුරැකුම්පත් පහසුවෙන් සමාලෝචනය සිදුකිරීමට තවකෙකුට ඉඩකඩ සැලසේ.

3. ආයෝජනයන්ට ආරක්‍ෂාව සැපයීම
කොටස් හුවමාරුව තුළ සිදුකරනු ලබන සියලුම ගණුදෙනු නිශ්චිතව නිර්වචනය කරන ලද රීති හා රෙගුලාසිවලට අනුව සිදුකෙරේ. කිසියම් වැරදි සහගත ක්‍රියාවක් සිදුකිරීම දැඩි දඬුවම් ලැබීමකට ද හේතු වි. එම නිසා කොටස් වෙළෙඳපොල තුළ ආරක්ෂාව සහතික වේ.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

4. ප්‍රාග්ධනය නිවැරදිව යොමු කිරීම
හොඳ ලාභයක් ලබාදෙන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට පුද්ගලයින් රුචිකත්වයක් දක්වනු ලබයි. යම් කාලසීමාවක් පුරා හොඳ ලාභාංශ නිකුත් කරන ලද සමාගම් වල කොටස් කෙරෙහි පුද්ගලයන්ගේ ඉතුරුම් යොමු කෙරේ.

5. අරමුදල් සම්පාදනය සඳහා සහභාගීවීම

විවිධ කාර්මික සුරැකුම්පත්වලට කොටස් හුවමාරුව විසින් ලබාදෙන ප්‍රසිද්ධිය හා ඒවායේ මිල ගණන්, මිලදී ගැනීම හා විකිණීම සඳහා ලබාදෙන පහසුකම් යනාදිය තුළින් පුද්ගලයන් ඉතිරි කිරීම් හා ආයෝජනය සඳහා පොළඹවාලනු ලබයි. මේ නිසා කර්මාන්තවලට අඛණ්ඩව මුදල් ප්‍රවාහයක් ගලායාම කොටස් හුවමාරුව මගින් සහතික කරනු ලබයි.

06. සමපේක්‍ෂණය සඳහා පහසුකම් සැපයීම

සමපේක්ෂණය කොටස් වෙළෙඳපල මෙහෙයුම් කටයුතුවල අන්තර්ගත කොටසකි. සමපේක්‍ෂණය නිසා සුරැකුම්පත් සඳහා වන ඉල්ලුම හා සැපයුම සමතුලිත තත්ත්වයකට පත් කෙරේ. මේ නිසා මිල වෙනස්වීම් සුමට ආකාරයට සිදුවේ.

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වැදගත්කම

1) සමාජයට ඇති වැදගත්කම

2) ව්‍යාපාර වලට ඇති වැදගත්කම

3) ආයෝජකයින්ට ඇති වැදගත්කම

සමාජයට ඇති වැදගත්කම

- ඵලදායී අරමුණු වලට අරමුදල් යොමු කිරීම තුලින් ආර්ථික වර්ධනය වේගවත් කිරීමට
- ලාභදායී ව්‍යාපාර වැඩි දියුණු කිරීමට
- හිඟ සම්පත් නිවැරදි පරිදි පූර්ණ උපයෝජනයට ලක් කිරීමට
- ආයතනික ප්‍රාග්ධන සම්පාදනයට
- රාජ්‍ය ණය ලබා ගැනීම් වලට පහසුකම් සැලසීමට

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ව්‍යාපාර වලට ඇති වැදගත්කම

- කොටස් හුවමාරුවෙහි ලියාපදිංචි වීමෙන් කීර්ති නාමය ඉහළ යාම හා ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නංවා ගත හැකි වීම
- සුරැකුම්පත් සඳහා පුළුල් වෙළෙඳපොළක් හිමි වීම
- විශාල අරමුදල් ප්‍රමාණයක් රැස්කරගත හැකි වීම
- කොටස් වෙළෙඳපොලේ මිල ඉහළ යන සමාගම් වලට කේවල් කිරීමේ අවස්ථාව හිමි වීම

ආයෝජකයින්ට ඇති වැදගත්කම

- ආයෝජන වල ද්‍රවශීලතාවය ඉහල යෑමට හේතු වීම
- ණය ලබා ගැනීමට කොටස් වෙළෙඳපොල සුරැකුම්පත් ඇපයට තැබීමට හැකි වීම
- සාධාරණ ගනුදෙනු කිරීමට හැකි වීම
- තමා සතු සුරැකුම්පත් වල නියම අගය තක්සේරු කර ගැනීමට හැකි වීම
- කොටස් මිලදී ගැනීමේ හා විකිණීමේ කටයුතු ක්ෂණිකව සිදුකල හැකි වීම

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

# මූල්‍ය පද්ධතිය

## මූල්‍ය ආයතන

**බැංකු අංශය**
- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- තැම්පත් භාරගන්නා ආයතන

**මූල්‍ය සමාගම්**
- සමූපකාර ග්‍රාමීය බැංකු
- සණස සමිති

**විශේෂිත මූල්‍ය ආයතන**
- කල්බදු සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවන්
- කොටස් තැරැව්කරුවන්
- ඒකක භාර
- ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්

ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන
- රක්ෂණ සමාගම්
- EPF
- ETF
- PPF

## මූල්‍ය උපකරණ

- භාණ්ඩාගාර බිලපත්
- භාණ්ඩාගාර බැදුම්කර
- සාමාන්‍ය කොටස්
- වරණීය කොටස්
- වාණිජ පත්‍රිකා
- සාංසමික බැඳුම්කර
- ඒකක

## මූල්‍ය වෙළෙඳපොළ

<u>මුදල් වෙළෙඳපොළ</u>
- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ
- දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
- වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ

<u>ප්‍රාග්ධන වෙළෙඳපොළ</u>
- භාණ්ඩාගාර බැදුම්කර වෙළෙඳපොළ
- සාංසමික බැදුම්කර වෙළෙඳපොළ
- කොටස් වෙළෙඳ පොළ

## මූල්‍ය යටිතල පහසුකම්

- තත්කාලීන දළ පියවීම් පද්ධතිය
- ඡායා පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය
- අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය

## නියාමන අධිකාරීන්

- මහ බැංකුව
- සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
- රක්ෂණ නියාමන කොමිෂන් සභාව
- සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972